# එක්සත් ජාතික පක්ෂය
# ஐக்கிய தேசிய கட்சி
# United National party

එක්සත් ජාතික පක්ෂ නායක, 2020.03.18
රනිල් වික්‍රමසිංහ මැතිතුමා
සිරිකොත,
අංක. 400,
කෝට්ටේ පාර,
පිටකෝට්ටේ.

**<u>එක්සත් ජාතික පක්ෂය බොරැල්ල කනත්තට ගෙන යාමට ඔබ සූදානම් කරන බස් රථයෙන් මම බැස යමි.</u>**

ජාතික යොවුන් පෙරමුණේ කෘත්‍යාධිකාරී මණ්ඩල සභිකයෙක්, රංජන් විජේරත්න දේශපාලන පීඨයේ පර්ෂද සංවිධායක වැඩසටහන පිළිබඳ දේශකයෙක් මෙන්ම අම්පාර දිස්ත්‍රික් කළමණාකරු ලෙස වර්තමාණයේ කටයුතු කරන මම අද දින ඉතාම කණගාටුවෙන් දරන තනතුරෙන් ඉවත් වන බව දැනුම් දෙමි.

ඔබතුමා නායකත්වය දැරූ පසුගිය වසර 26 තුළ එක්සත් ජාතික පක්ෂය රැකීමට පුද්ගලික ධනය, කාලය, ශ්‍රමය, ජීවිත කැප කළ සමාජයේ ඉහළ සිට පාක්ෂිකයා දක්වා සියලුම දෙනා ඔබතුමා විසින් අද අසරණ කර ඇත. ඔබතුමාගේ දරදඬු තීරණ නිසා අද පක්ෂය බෙදීමකට ලක්ව ඇත. බෙදුණු පක්ෂයක හෘද සාක්ෂියට එකඟව තවදුරටත් ඔබතුමාගේ නායකත්වය යටතේ රැඳී සිටීමට නොහැක. ඔබගේ නායකත්වය යටතේ එක්සත් ජාතික පක්ෂය තුළින් ජනාධිපතිවරයෙකු බිහි කිරීමට ඔබතුමා අසමත් වූවා මෙන්ම පැවති පාර්ලිමේන්තු මැතිවරණ 4ක් පරාජයට පත්ව ඇතුවා මෙන්ම 2001 හා 2015 වර්ෂවල බලය ලබා ගත්තාද ලබා ගත් බලය රැක ගැනීමට ඔබ අසමත් විය.

මාගේ දේශපාලන ජීවිතයේ වසර 22ක් එක්සත් ජාතික පක්ෂය තුළ රැදෙමින් දෙවුන්දර තුඩුවේ සිට පේදුරුතුඩුව දක්වා ඔබතුමා කියූ සෑම තැනකටම පක්ෂය වෙනුවෙන් පාක්ෂිකයා සමඟ සංවිධානය වී කටයුතු කළෙමි. මාගේ තරුණ ජීවිතය මේ පක්ෂය වෙනුවෙන් කැප කළද පුද්ගලිකව මා වෙත දෙයක් නොලැබීමට වඩා මම දුක්වන්නේ ඔබතුමා පක්ෂය භාරගන්නා විට වයස අවුරුදු 20ක් වූ තරුණයා අද වයස අවුරුදු 46ක් වීම තුළ ඔහුට අද රජයේ කම්කරු රැකියාවක්වත් ලබා ගැනීමට නොහැකි වී තිබීමයි.

ඔබතුමා බලය ගැනීමට පෙර සම්මේලන පවත්වා ඡන්දපොළ නියෝජිතයින්ගේ, ශාඛා සමිති නිළධාරීන්ගේ දරුවන්ට කුමන හෝ රජයේ රැකියාවක් දෙනවායැයි පොරොන්දු දුන්නද, ඒවා ඉටු නොකිරීම තුළ මේ රටේ ගම්මානවල ජීවත් වන එක්සත් ජාතික පාක්ෂිකයාගේ දුවා දරුවන් වයසට යමින් රැකියා නොමැතිව තවමත් ගෙවල්වලය ඔබතුමා බලය ලබා ගත් කිසි දිනක පාක්ෂිකයා නඟා සිටුවීමට වැඩපිළිවෙළක් හැදුවේ නැත. මේ දිනවල නම් බොහෝම කුළුපඟව සිරිකොතට වී පැමිණෙන පාක්ෂිකයන් කීපදෙනා සමඟ ඡායාරුප වලට පෙනී සිටිනවා දුටුවෙමි.
මාගේ ගැටලුව නම් බලයේ සිටින විට පාක්ෂිකයා සමඟ එම කුළුපඟ බව පවත්වා ගැනීමට ඔබතුමා අසමත් වූයේ ඇයිද යන්නයි?, 2018 වසරේ අඟ භාගයේ අපගේ රජය දින 52ක් නොමැති වූ අවස්ථාවේ එ.ජා.ප පාක්ෂිකයා ඔබතුමා සමඟ සිටිමින් නැවත රජය ලබා දීමය කටයුතු කළෙමි. බලය ලබා ගත් පසුව පැහැදිලි වැඩපිළිවෙළක් ජනාධිපතිවරණයක් හා මහමැතිවරණයක් ආසන්නව තිබියදී පවා පාක්ෂිකයා වෙනුවෙන් ක්‍රියාවට නැංවීමට ඔබ අසමත් විය. ඒ කොතෙක් ද යත් ජනපතිවරණය ආසන්නයේ ලබා දුන් ව්‍යාපෘති සහකාර, සමෘද්ධි පරිගණක සහයක, පුරාවිද්‍යා රැකියා ලාභීන් සියලු දෙනා විධිමත් ආකාරයට පත්වීම් ලබා නොදීම නිසා රැකියා අහිමිව අද නිවෙස් වල තනි වී ඇත.

ඔබතුමා පක්ෂයට නායකත්වය දුන් පසුගිය වසර 26 තුළ පක්ෂයේ දෙවන පෙළක් හදනවා වෙනුවට ඔබතුමාගේ නායකත්වය ආරක්ෂා කර ගැනීමට කෘත්‍යාධිකාරී මණ්ඩලය දඩමීමා කරගෙන ඔබ කටයුතු කිරීම තුළ පක්ෂයේ සිටි තරුණ නායකයින් විශාල ප්‍රමාණයක් මෙන්ම ගම්මට්ටමේ පාක්ෂිකයන් බොහොමයක් පක්ෂය හැර ගියේය. ඔබතුමා කරගෙන පැමිණි වැරදි වැඩපිළිවෙළෙහි අවසන් අදියරේ ප්‍රතිඵලයක් ලෙස බහුතර පාක්ෂිකයින් ආදරය කරන පක්ෂයේ නියෝජ්‍ය නායක සජිත් ප්‍රේමදාස මැතිතුමා පක්ෂයෙන් එළියට තල්ලු වී ඇත.

ජනතාවගේ හදවත් දිනා ගත් බිම් මට්ටමේ පාක්ෂිකයන්ගේ දුක කඳුල හඳුනන සියලු නායකයින් පක්ෂයෙන් එළවා දමා අතළොස්සක් සිටින පක්ෂයක නායකත්වය දීමට ඔබතුමා දරන උත්සහය පිළිකුළෙන් යුක්තව ප්‍රතික්ෂේප කරන අතර මේ ලිපිය ලියන අද දින දක්වා පක්ෂය එකමුතු කරයියැයි සිතුවත් එය ඔබතුමාගෙන් ඉටු නොවන නිසා, එක්සත් ජාතික පක්ෂය බොරැල්ල කනත්තට ගෙන යාමට ඔබ සූදානම් කරන බස් රථයෙන් මම බැස යන බව දන්වා සිටිමි. එක්සත් ජාතික පක්ෂය ඔබතුමාගේත් තනි බූදලයක් නොවන බැවින් පොඩි හෝ නුවණක් ඇත්නම් දැන්වත් පක්ෂය දෙවන පෙළ නායකයින්ට භාර දී විශ්‍රාම ගන්නා ලෙස ඉතා කාරුණිකව ඉල්ලා සිටිමි.

ස්තුතියි.



සුරේෂ් ද සිල්වා,
දිස්ත්‍රික් කළමණාකරු අම්පාර.
(එක්සත් ජාතික පක්ෂය)

පිටපත්

1. නියෝජ්‍ය නායක, සජිත් ප්‍රේමදාස මැතිතුමා.
2. මහලේකම්, අකිල විරාජ් මැතිතුමා.
3. දිස්ත්‍රික් සභාපති, වෛද්‍ය අනෝමා ගමගේ මැතිතුමිය.